# ශ්‍රී ලංකාවේ ප්‍රධාන මැතිවරණ නිරීක්ෂණ ආයතන මගින් නිකුත් කරනු ලබන ඒකාබද්ධ නිවේදනය

ඌව පළාත් සභා ඡන්ද විමසීම 2014,
සඳහා තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ ප්‍රධානීන් හා
ලේකම්වරුන් සහ පොලිස්පති තුමා

2014 අගෝස්තු 12

**මැතිවරණ නීති උල්ලංඝණය කිරීම වළක්වාලීම සඳහා සුදුසු පියවර ගැනීම හා මැතිවරණ කටයුතුවල නියැළෙන නිළධාරීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කෙරෙන ඉල්ලීමයි.**

ඔබ සැම දැනටමත් දන්නා පරිදි, මෑතකාලීනව මෙරට පැවැති පළාත් සභා ඡන්ද විමසීම් තුළදී මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හට තර්ජනය කිරීම් හා සම්බන්ධ සිදුවීම් ගණනාවක් මේ වන විට වාර්තා වී ඇත. මේ අනුව පසුගිය දකුණු, වයඹ හා බස්නාහිර යන පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළ ව හෝමාගම, කැස්බෑව (බස්නාහිර) වැලිගම,මාතර (දකුණ) හා මහව (වයඹ) යන ප්‍රදේශවල සිදු වූ එවැනි සිද්ධීන් මීට නිදසුන්ය. පසුගිය දශකයක කාලසීමාව තුළ පැවති අනෙකුත් මැතිවරණ හා සංසන්දනය කිරීමේදී මැතිවරණ නිළධාරීන්හට තර්ජනය කිරීම්වලට අදාළ සිද්ධීන්වල පැහැදිලි වර්ධනයක් සිදුවී ඇති බව පෙනී යයි.

ඊට අදාළ ව ඇති වූ නවතම සිද්ධිය පසුගිය දා එනම් අගෝස්තු 06 වැනි දින ඌව පළාත් සභා ඡන්ද විමසීමට අදාළ ව පැවති නාම යෝජනා භාර ගැනීමේ දිනයේ දී බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. මෙදින ඌව පළාත් සභාවේ හිටපු අමාත්‍යවරයෙකු වූ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එ.ජ.නි.ස) අනුර විදානගමගේ හා ඔහුගේ සොහොයුරු, බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තේනුක විදානගමගේ (එ.ජ.නි.ස) යන අය විසින් ඉතා විශාල රථ පෙළපාලියක් සංවිධානය කර තිබූ අතර ඔවුන්ගේ අරමුණ වී තිබුනේ මහියංගනයේ සිට බදුල්ල දක්වා ගමන් කිරීමයි. ඉතා විශාල ප්‍රමාණයක එ.ජ.නි.ස ආධාරකරුවන් හා 150 කට අධික වාහන ප්‍රමාණයකින් සමන්විත වූ මෙම රථ පෙළපාලිය ලොග්ගල්ඔය ප්‍රදේශයට ප්‍රවේශවන අවස්ථාවේදී, ඌව පළාත් සභා ඡන්ද විමසීමේ විශේෂ රාජකාරී සඳහා යොදවා සිටි කුරුණෑගල නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් චමින්ද නාමල් තලංගම මහතාගේ උපදෙස් පරිදි පොලිස් නිලධාරින් කිහිප දෙනෙකු විසින් එය නතර කිරීමට උත්සාහ කරන ලදි. මෙහිදී අදාළ නි.කොමසාරිස්වරයාට හා පොලිස් නිලධාරින් හට සන්ධාන ආධාරකරුවන් තර්ජනය කර ඇති අතර නි.කොමසාරිස්වරයා සතු කැමරාව බලහත්කාරීව ලබා ගනිමින් එහි සටහන්ව තිබූ සියලු ඡායාරූප හා වීඩියෝ පටද එකී ආධාරකරුවන් විසින් මකා දමා ඇත. මෙම අනපේක්ෂිත සිදුවීම හේතුවෙන්, සන්ධාන ආධාරකරුවන්ගේ වාග් ප්‍රහාර හා තර්ජනයට ලක් වූ නි. කොමසාරිස්වරයා තම ආරක්ෂාව පිළිබඳව සලකා, විකල්ප මාර්ග ඔස්සේ බදුල්ල නගරයට පැමිණ පොලිසියට තම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. මේ අතර සන්ධාන ආධාරකරුවන්ගෙන් කොටසක් හාලිඇල හා බදුල්ල යන ප්‍රදේශ හරහා බණ්ඩාරවෙල නගරයට පැමිණ ඇති අතර ඔවුන්ගෙන් තවත් පිරිසක් මැතිවරණ නීති ඉතා බරපතල ලෙස උල්ලංඝණය කරමින් මීගහකිවුල ප්‍රදේශයේ රැඳී සිට ඇත. එ.ජ.නි.ස හා එ.ජා.ප ආධාරකරුවන් සහිත තවත් රථ පෙළපාලි කිහිපයක් ද බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක ගමන්කර ඇති බවටද වාර්ථා වී ඇත්තේ වුව ද, අපගේ අවධානය වඩාත් යොමු වී ඇත්තේ ලොග්ගල්ඔයට ආසන්නව හටගත් ඉහත කී සිද්ධිය පිළිබඳවයි. ඊට හේතුව වන්නේ මැතිවරණ රාජකාරියේ නියුතු උසස් නිලධාරියෙකුට මෙසේ තර්ජනය කිරීම ඉතා කණස්සලුසහගත සිද්ධියක් වීමයි.

මැතිවරණ කාලසීමාව තුළ විශේෂයෙන් ම, අගෝ. 05 හා 06 යන දිනයන්හි දී පෙළපාලි හා රථ පෙළපාලි පැවැත්වීමෙන් වළකින ලෙස දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලින් ඉල්ලා සිටිමින් හා එවැනි ක්‍රියා වැළකීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් මැතිවරණ කොමසාරිස්වරයා PCE/2014/UVA/4B යන අංක යටතේ ජූලි මස 31 වැනි දින චක්‍රලේඛයක් ද නිකුත්කර තිබුණි. ඊට අමතරව, අගෝස්තු මස 5 වැනි දින සිට 29 වැනි දින දක්වා පැවැත්වෙන අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත්වන සිසුන් හට බාධාකාරී ලෙස තම මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු නොකරන ලෙස ද මැතිවරණ කොමසාරිස්වරයා විශේෂයෙන්ම ඉල්ලා සිටින ලදි. එමෙන්ම එතුමන් විසින් ගන්නා ලද තවත් සාධනීය පියවරක් වූයේ ''ආචාර ධර්ම පද්ධතියක්'' එළිදැක්වීමයි. වසර 2009 අංක 55 දරණ පනතින් සංශෝධනය කරන ලද පරිදි, 1981 අංක 04 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8 (8) වැනි වගන්ති ප්‍රකාර ව මෙකී ආචාර ධර්ම පද්ධතිය සකස් කර ඇති අතර ඡන්ද විමසීමක දී තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් මෙකී ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරනු ඇතැයි යන්න මැතිවරණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

මෙවන් සුභවාදී උත්සාහයන් මධ්‍යයේ වුවද, නාමයෝජනා පැවති දින සිදුවූ ඉහත කී සිදුවීම මගින් ජනිත කර ඇති වාතාවරණය හමුවේ සියලු සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වඩාත් කණස්සල්ලට පත්ව සිටින බව අප හට වාර්තා වී ඇත. කිසිදු බියක් හා පක්ෂපාතීත්වයකින් තොරව, අපක්ෂපාතීව තම කටයුතු සිදුකර ගෙන යාමට අවශ්‍ය ආරක්ෂාව හා සුදුසු වාතාවරණයක් සකස් කර දීම, මේ අනුව අද දවසේ වඩාත් ප්‍රමුඛත ම කාර්යය විය යුතුව ඇත. මේ අනුව වහා අවධානයට ලක්විය යුතු විශේෂ කරුණු කිහිපයක් මෙහිලා සටහන් කළ යුතුය. ඉහත කී දැවැන්ත රථ පෙළපාලිය සඳහා උපයෝගී කරගත් 150 කට අධික වාහන අතරින් විශාල ප්‍රමාණයක් ''ඩිෆෙන්ඩර්''වර්ගයේ ජීප් රථ වූ අතර එවැනි වාහන බොහෝ දුරට භාවිතා කරනු ලබන්නේ දේශපාලනඥයන් හා ආරක්ෂක හමුදාවලට අනුබද්ධ සමහර අංශ විසිනි. දෙවනුව ඒ සඳහා සහභාගී වූ පිරිස් අතරින් බොහෝ දෙනෙක් දේශපාලනඥයන්ගේ ආරක්ෂාව සඳහා ඇමති ආරක්ෂක අංශය (MSD) විසින් අනුයුක්ත කර තිබූ ආරක්ෂක නිලධාරීන් බව තහවුරු වී ඇත. මෙකී සිදුවීම් නැවත සිදුවීම වළක්වාලීම සඳහා නිසි පියවර ගැනීම අත්‍යවශ්‍යවන්නාසේම අදාළ දේශපාලන ප්‍රධානීන් ද මැතිවරණ නීති පිළිපැදීම සඳහා ක්‍රියාවෙන් මෙන්ම වචනයෙන් ද ඇපකැප විය යුතුව ඇත. එසේ නොවුවහොත් සැප්තැම්බර් මස 20 වැනි දින පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම තුළ අත්‍යාවශ්‍යයෙන් ම පැවතිය යුතු සුපිළිපන්නභාවයට බලවත් හානියක් සිදුවිය හැකිය.

මේ අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට හානිකර වන්නා වූ කවර හෝ ක්‍රියාවකින් වැළකීම සඳහා තම අපේක්ෂකයින්ට අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලෙස සියලු දේශපාලන පක්ෂ නායකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින අතර, මැතිවරණ රාජකාරිවල නියුතු සියලු නිලධාරීන් ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙෂ ද අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නෙමු.

තවද, පොදු දේපළ හා අනෙකුත් රාජ්‍ය සම්පත් මෙන්ම ඇමති ආරක්ෂක අංශයේ නිළධාරීන් හා වාහන ආදිය අවභාවිතාවේ යොදා ගන්නා අපේක්ෂකයන්ට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස මැතිවරණ රාජකාරියේ නියුතු නිළධාරීන්හට ප්‍රමාණවත් පරිදි ආරක්ෂාව ලබා දෙන ලෙස ද පොලිස්පති තුමාගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමු. දැනට ගැටුම්කාරී තත්ත්වයන් උද්ගත වී ඇති මහියංගනය වැනි ප්‍රදේශ හඳුනා ගනිමින් එවැනි ප්‍රදේශ වෙත අපක්ෂපාතී හා වෘත්තීමය පොලිස් නිලධාරීන් අනුයුක්ත කිරීම ද මෙහිලා අතිශය වැදගත්ය. ඊට අමතරව මැතිවරණය පැවැත්වෙන සමස්ත කාල සීමාව තුළ ඇමති ආරක්ෂක අංශයේ නිලධාරීන් හට තමාගේ අදාළ නිළ ඇඳුමින් සැරසී රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදිය හැකි නම් එය ද ඉතා වැදගත් වනු ඇත.

මැතිවරණ ක්‍රියාදාමයේ සුපිළිපන්බව ආරක්ෂා කර ගැනීම සඳහා දේශපාලන පක්ෂවල, විශේෂයෙන්ම දැනට පාලන බලයේ සිටින සන්ධානයට අයත් පක්ෂවල නායකයන්ගේ සැබෑ මැදිහත්වීමක් මෙහිලා අවශ්‍යය.

ජනතාවට වඩාත් වැදගත් හා අදාළ කරුණක් බැවින් මෙම ලිපිය නිවේදනයක් ලෙස මාධ්‍ය වෙත ද නිකුත් කරන බව කරුණාවෙන් සළකන්න.

මීට අදාළව ඔබ ලබා දෙන සහාය අගය කොට සලකමු.

ස්තුතියි

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු - මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (සී.එම්.ඊ.වී)

රෝහණ හෙට්ටිආරච්චි - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල්)

කීර්ති තෙන්නකෝන් - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (කැෆේ)